### මාර්ගගතව අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

**A.** **මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි කැපිටල් අකුරින් පමණක් පිරවිය යුතුය.**

**B.** **මාර්ගගත අයදුම්පතේ "Medium, Town applied, Personal Information"කොටස් මාර්ගගත ආකාරයෙන් (online) සම්පූර්ණ කළ යුතුය.**

**C.** **සම්පූර්ණ කරන ලද තොරතුරු නිවැරදිව හා දී ඇති උපදෙස් පරිදි සම්පූර්ණ කර තිබේදැයි පරීක්ෂා කර තහවුරු කරගන්න. ( පොදු උපදෙස් හා තාක්ෂණික උපදෙස් පරිදි)**

**D.** **ඉන් පසු "Submit this application" හා "Proceed to payment" click කර, මුදල් ගෙවා "Complete and Submit" click කර අයදුම්පත මාර්ගගතව යොමු කළ යුතුය.**

**E.** **අයදුම්පතේ මෘදුපිටපත බාගත කර (download), මුද්‍රිත පිටපතක් ලබාගත යුතුය. (printout)**

**F.** **මුද්‍රිත පිටපතේ අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සම්පූර්ණ කලයුතු තොරතුරු තම අත්අකුරින් පිරවිය යුතුය.**

**G.** **මෙසේ සම්පූර්ණ කරන ලද දෘඪපිටපත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. පසුව කරන ලද විමසීම් සඳහා එහි පිටපතක් ළඟ තබාගත යුතුය.**

**H.** **අයදුම්කරුවන් හට මුදල් ගෙවීමේ ක්‍රමවේදය(Payment Method) වෙනස්කල හැක්කේ එක් වරක් පමණි.**

**I.** **දී ඇති උපදෙස් වලට පටහැනිව යොමු කරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**<u>(අ) පොදු උපදෙස්:</u>**

1. මාර්ගගත (online) විභාග අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණි.
2. අයදුම්පත පිරවීමේදී විශේෂිත අක්ෂර (Special Characters) වන " " ?: { }[ ]'!`~#$%^* < > = + - _ | නොයෙදිය යුතුය. එවැනි විශේෂිත අක්ෂර යොදා සම්පූර්ණ කර ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
3. විභාග ගාස්තු ගෙවීමේදී පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.
   i. බැංකු ණය කාඩ්පතක් මගින් (Bank Credit Card)

ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සක්‍රීය කර ඇති බැංකු හර කාඩ්පතක් මගින් (Bank Debit Card with internet payment facility)

iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකින් ක්‍රමය (Bank of Ceylon Online Banking bill payment Method)

iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Bank of Ceylon branch)

v. ඕනෑම තැපැල් කාර්යාලයක් මඟින් (Any Post Office)

ඉහත ක්‍රම මඟින් ගෙවීම් කරනු ලබන ආකාරය සඳහා **(ආ) තාක්ෂණික උපදෙස්** බලන්න.

4. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂයන් සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලබන අතර, විභාග ගාස්තු ආපසු ගෙවීම (Refund exam payment) හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම හෝ කරනු නොලැබේ.

5. අයදුම්කරු විසින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පතේ දත්ත, මාර්ගගත පද්ධතියට ඇතුළත් කිරීමට පෙර, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවන ලද නීති රීතිවලට එකඟවන බව තහවුරු කළ යුතුය.

6. අදාළ විභාගයට මුදල් ගෙවා අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු ("**Complete and Submit**"), එය බාගත කර (download), මුද්‍රිත පිටපතක් ලබාගත යුතුය (printout).

7. අයදුම්පත් සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන බලපැවැත්වේ.

- අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සහිත අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- මුදල් නොගෙවන ලද අයදුම්පත් (විශේෂිත විභාග සඳහා හැර) ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අයදුම්පතේ මුද්‍රිත පිටපතේ අදාළ අත්සන් යොදා දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචි තැපැල මඟින් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර, **විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ** යන ලිපිනය වෙත එවිය යුතු වේ. එසේ මුද්‍රිත පිටපත සම්පූර්ණ කර නොඑවුව හොත් මාර්ගගත අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අයදුම්පත තැපැලේදී නැතිවීම හෝ ප්‍රමාද වීම සම්බන්ධව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් වගකියනු නොලැබේ.

8. විමසීම් කිරීම.

- බඳවා ගැනීම් සහ සුදුසුකම් පිළිබඳව (රාජ්‍ය සේවා කොමිෂන් සභාව) – 011-2136600
- විභාග අයදුම්පත් සහ සංවිධානය පිළිබඳව - 011-2785230
- තැපැල් කාර්යාල මගින් ගෙවීම් පිළිබඳව - ඍජු ඇමතුම් 1950
- ලංකා බැංකු ශාඛා මගින් ගෙවීම් පිළිබඳව - 011 2205280

- මුදල් ගෙවීම් පද්ධතියේ යාවත්කාලින වී නොමැතිනම් පමණක් අදාල තොරතුරු (නම,ජාතික හැඳුනුම්පත් අංකය, Reference Number, මුදල් ගෙවූ ලදුපතේ ඡායාරූපයක්) සමග it@doenets.lk වෙත e-mail කරන්න.

9. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එහි සඳහන් වන තොරතුරු කිසිවක් කිසිදු හේතුවක් මත පසුව වෙනස් කරනු නොලැබේ. එබැවින් අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ පූර්ණ වගකීම වේ.
10. අයදුම්පතේ මුද්‍රිත පිටපතේ සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ.
11. අයදුම්පත භාර ගන්නා අවසාන දිනට මෘදු පිටපතේ (Soft copy) හා දෘඩ පිටපතේ (Hard copy) සඳහන් තොරතුරු නිවැරදි තොරතුරු බවට සලකා ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.


## (ආ) තාක්ෂණික උපදෙස් :

1. **පද්ධතියට ප්‍රවේශ වීම**

   i. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට ප්‍රවේශ වන්න (www.doenets.lk).


   ii. එහි අපගේ සේවාවන් (Our Services) යටතේ ඇති "**Online Applications (Recruitment Exams)** " මුහුණත (Tile) මත Click කරන්න.

   iii. ඉන්පසු ඔබට පහත දිස්වන වෙබ් පිටුවට ප්‍රවේශ විය හැක.




   iv. එහි ඇති "**Apply for Exams**" මගින් අදාළ විභාගය වෙත ප්‍රවේශ විය හැක.


2. **“Apply for Exams”**





i. අයදුම් කළ හැකි විභාග සම්බන්ධ තොරතුරු ඉහත කවුළුවෙන් දිස්වේ.

ii. එහිදී විභාගය සම්බන්ධ ගැසට් නිවේදනය බාගත කළ හැක.

➢ **Apply** - පළමුව ඔබට ප්‍රවේශ වීමේ කවුළුවක් (Login Window) දර්ශනය වන අතර එහි ඔබේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීම අනිවාර්ය වේ. එයට අමතරව ජංගම දුරකථන අංකය හෝ ඊ-මේල් ලිපිනය හෝ ඒ දෙකම හෝ ඇතුළත් කර **“I Agree with the Terms and Conditions”** “√” කර **reCAPTCHA** “√” කර **“Next”** Click කරන්න.



➢ ඔබට පහත කවුළුව (Verify OTP Window) දිස්වේ. ඔබගේ ජංගම දුරකථන අංකයට (SMS මගින්) හෝ ඊ-මේල් ලිපිනයට ලැබී ඇති **OTP verification code** ඇතුළත් කර “**Next**” click කරන්න.



### 3. අයදුම්පත සම්පූර්ණ කිරීම.

පහත අයිතමයන් සම්පූර්ණ කිරීමේ දී දක්වා ඇති උපදෙස් පිළිපදින්න.

i. සම්පූර්ණ කළ යුතු මාර්ගගත අයදුම්පතේ ඇති අයිතමයන්හි * සලකුණ යොදා ඇති සෑම අයිතමයක්ම ඔබ විසින් අනිවාර්යයෙන් පිරවිය යුතු වේ.

ii. සම්පූර්ණ නම (**Full Name**), මුලකුරු සමඟ නම (**Name with Initials**) ඇතුළත් කිරීමේ දී පහත නිදසුන් පරිදි ENGLISH BLOCK CAPITALS යොදා ගනිමින් ඔබගේ නම අදාළ අයිතමයන්හි ඇතුළත් කරන්න.

#### Personal Information

* Name in full (in Block Capitals)

HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA

e.g : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA

* Name with initials at the end (In Block Capitals)

GUNAWARDHANA H. M. S. K

iii. ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (**Address to which the Admission Card should be sent**)

- ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය නිවැරදිව අදාළ අයිතම (fields) තුළ ඇතුළත් කරන්න.

ලිපිනය සඳහන් කිරීමේදී පහත උදාහරණය පරිදිම කොමා ලකුණු යොදා ඉංග්‍රීසි කැපිටල් අකුරින් ඇතුලත් කිරීම අනිවාර්යයවේ. උපදෙස් අනුගමනය නොකිරීම නිසා ප්‍රවේශපත් නොලැබීමද සිදුවියහැක.

Official Address (Must use Commas (,) and type IN BLOCK CAPITAL LETTERS as shown in the example) *

MINISTRY OF FINANCE, LOTUS ROAD, COLOMBO 01.

E.g. : MINISTRY OF FINANCE, LOTUS ROAD, COLOMBO 01.

iv. විභාගයට ඉදිරිපත්වනු ලබන භාෂා මාධ්‍යය (**Medium**), ස්ත්‍රී පුරුෂ භාවය (**Gender**), ජාතික හැඳුනුම්පත් අංකය (**National Identity Card Number**) හා අනෙකුත් අයිතමයන් නිවැරදිව පුරවන්න.

- විභාගයට ඉදිරිපත්වනු ලබන භාෂා මාධ්‍යය

Medium : *

(◉) Sinhala ( ) Tamil ( ) English

Medium cannot be changed once you submitted the application.

- ස්ත්‍රී/පුරුෂ භාවය

Sex : *

Female

- ජාතික හැඳුනුම්පත් අංකය
- උපන් දිනය








v. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

- මාර්ගගත අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන සහතික කිරීම සඳහා ලබා දී ඇති ප්‍රකාශයන් ඔබට කියවීම හා තේරුම් ගැනීම (**Read and understand only**) සඳහා පමණක් ප්‍රදර්ශනය (display) කරනු ලබයි.
- ඉන්පසු මුද්‍රිත පිටපතෙහි තම අත්සන යොදා එය සහතික කරගත යුතු වේ.

vi. සම්පූර්ණ කරන ලද අයදුම්පතේ සංශෝධන සිදුකිරීම

අයදුම්පත සම්පූර්ණ කිරීමෙන් පසු ඔබට වම්පස පහත රූපයේ දිස්වන පරිදි button දෙකක් දක්නට ලැබේ.





- "**Save**" - මෙය click කිරීමෙන් ඔබට අයදුම්පත් භාරගන්නා අවසාන දිනය හා වේලාව තෙක් ඔබගේ තොරතුරු පිරවිය හැකි වේ. එනම් නැවත මාර්ගගත පද්ධතියට පිවිස තම තොරතුරු ඇතුළත් කිරීම සිදු කළ හැකිය. නැවත මාර්ගගත පද්ධතියට පිවිසීම සඳහා පද්ධතියට ප්‍රවේශ

වන (**Our Services**) යටතේ ඇති "**Online Applications (Recruitment Exams)**" මුහුණත (Tile) මත Click කර "**Edit & Submit**" Click කරන්න.

නමුත්, ඔබ විසින් "**Submit this application**" click නොකර ඉදිරි ක්‍රියාවලීන් සිදු නොකරන්නේ නම්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනය හා වේලාවෙන් පසුව ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප වේ.

- "**Submit this application**" - අයදුම්පතේ සියලු තොරතුරු ඇතුළත් කළ පසු ඉදිරියට යාමට "**Submit this application**" click කළ යුතුය.

"**Submit this application**" click කළ පසු ඔබ විසින් ඇතුළත් කරන ලද තොරතුරු පහත රූපයේ පරිදි දිස්වේ (preview).



Language Medium

| | |
|---|---|
| Language Medium | Sinhala |
| Are you appearing at the examination under the disabled rehabilitation condition as per para 01 (ii) of the gazette notification? | No |

Personal Informations

| | |
|---|---|
| Name in full (In Block Capitals) | HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA |
| Name with initials at the end (In Block Capitals) | GUNAWARDHANA H.M.S.K. |
| National Identity Card No | 200111111111 |
| Permanent Address (In Block Capitals) | No: 234/1/A, SADAHAM MAWATHA, SOYZAPURA, |
| Postal Town of Permanent Address (In | MORATUWA. |

Certification of the applicant

Attestation of Applicants' Signature


Certification of the Head of the Institution (Government/ Provincial Government/Government and Non-Government Co-operation applicants only)

I hereby confirm that the information provided here is accurate, correct and complete.

Proceed to payment

යම් හෙයකින් ඔබගේ තොරතුරු නැවත සංශෝධනය (**Edit**) කළ යුතු නම්, නැවත අයදුම්පත වෙත ගොස්( ⟶ ) , සංශෝධනය (**Edit**) කර, "**Submit this application**" click කිරීමෙන් ඉදිරියට යා හැකිය.

ඇතුළත් කරන ලද තොරතුරු නිවැරදි නම් පහත රූපයේ පරිදි එකඟතාව පළකිරීමෙන් ඉදිරියට යා හැකිය.




"**Proceed**" click කිරීමෙන් පසු පහත පරිදි දිස්වේ.





“**Proceed to payments**” click කිරීමෙන් මාර්ගගතව විභාග අයදුම්පත් සඳහා මුදල් ගෙවීමේ පිටුවට යොමු වේ.

4. **විභාග ගාස්තු ගෙවීම.**


**සැ.යු. අයදුම්කරුවන් හට විභාග ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය(Payment Method) වෙනස් කිරීමට හැකියාව ලබාදී ඇත්තේ එක්වරක් පමණි.**

පහත රූපයේ පෙන්වා ඇති පරිදි ඔබ විසින් විභාග ගාස්තු ගෙවීමට බලාපොරොත්තු වන ක්‍රමවේදය තෝරන්න.





➢ **Pay with Credit/Debit Card** ක්‍රමවේදය

- මේ සඳහා සේවා ගාස්තු වශයෙන් විභාග ගාස්තුවෙන් 1.7% ක මුදලක් අයකරනු ලබයි.
- ඉහත ක්‍රමවේදයෙන් ගෙවීම් කිරීම සඳහා ඔබගේ **Credit/Debit** කාඩ්පත අන්තර්ජාල ගෙවීම් පහසුකම සක්‍රීය කර ඇති බැංකු **Credit/Debit** කාඩ්පතක් විය යුතුය.
- එසේ නොවන බැංකු **Credit/Debit** කාඩ්පත් මගින් ගෙවීම් කල නොහැකිවන අතර ඔබගේ ගෙවීම ප්‍රතික්ෂේප වේ.



- **Pay with Post** ක්‍රමවේදය


“**Pay with Post**” මඟින් මුදල් ගෙවීමේ දී පහත පරිදි ඔබට යොමු අංකයක් (Reference Number) ලැබේ. එය රැගෙන ඕනෑම තැපැල් කාර්යාලයක් වෙත ගොස් මුදල් ගෙවීම් සිදුකර නැවත මාර්ගගත පද්ධතියට පිවිසිය යුතුය. **සේවා ගාස්තු වශයෙන් එක් අයදුම්පතක් සඳහා රු.20.00 ක මුදලක් අයකරනු ලබයි.**





- **Pay with BOC** ක්‍රමවේදය

“**Pay with BOC**” මඟින් මුදල් ගෙවීමේ දී පහත පරිදි ඔබට යොමු අංකයක් (Reference Number) ලැබේ. එය රැගෙන ඕනෑම ලංකා බැංකු ශාඛාවක් වෙත ගොස් හෝ ලංකා බැංකු ඔන්ලයින් බැංකින් ක්‍රමවේදයෙන්(Bank of Ceylon Online Banking bill payment method) හෝ මුදල් ගෙවීම් සිදුකර නැවත මාර්ගගත පද්ධතියට පිවිසිය යුතුය. විභාග දෙපාර්තමේන්තු ගිණුම් අංකයට සෘජුවම Slip මගින් ගෙවීම් නොකල යුතුය.


සැ.යු: **“Pay with BOC” මඟින් ගෙවීම් කිරීමේදී ලංකා බැංකුව විසින් සේවා ගාස්තු වශයෙන් එක් අයදුම්පතක් සඳහා රු.20.00 ක මුදලක් අයකරනු ලබයි.**



- මුදල් ගෙවූ පසු නැවත මාර්ගගත පද්ධතියට පිවිස එහි ඇති “**Continue after Payment**” click කරන්න.




- ඉන්පසු පහත රූපයේ පරිදි ඔබගේ යොමු අංකය (**Reference Number**) පද්ධතියට ඇතුළත් කර ඉදිරියට යන්න.





***“මුදල් ගෙවීම් පද්ධතියේ යාවත්කාලීන වී නොමැතිනම් අදාල තොරතුරු (නම,ජාතික හැඳුනුම්පත් අංකය, Reference Number, මුදල් ගෙවූ ලදුපතේ ඡායාරූපයක්) සමග it@doenets.lk වෙත e-mail කරන්න.”***

- ඉහත ක්‍රම මඟින් මුදල් ගෙවූ පසු, මුදල් ගෙවූ බවට අදාළ ලදුපත ප්‍රදර්ශනය වන අතර, එය මුද්‍රණය කර ගත හැක. එසේම මෙම තොරතුර ඔබගේ ජංගම දුරකථන අංකයට (SMS මඟින්) හෝ ඊමේල් ලිපිනයටද යැවේ.



### 5. අයදුම්පත මාර්ගගතව යොමු කිරීම


මුදල් ගෙවූ පසු අයදුම්පත මාර්ගගතව යොමු කිරීම සඳහා පහත රූපයේ පරිදි විභාග දෙපාර්තමේන්තු කොන්දේසිවලට (**Terms and Conditions**) එකඟවන බවට හා අයදුම්පත යොමු කිරීම තහවුරු කිරීම (**Confirm**) සිදුකළ යුතුය. ඉන්පසු “**Complete & Submit**” click කරන්න.



6. **අයදුම්පත බාගත කිරීම (Download) හා මුද්‍රිත පිටපත (Print) ලබා ගැනීම**

පහත රූපයේ පරිදි "**Download my application**" click කිරීමෙන් ඔබගේ අයදුම්පත බාගත කර ගත හැක. බාගත කරගත් පසු එහි මුද්‍රිත පිටපතක් ලබාගන්න. එම මුද්‍රිත පිටපතෙහි මාර්ගගතව පුරවන ලද තොරතුරුහි කිසිදු සංශෝධනයක් (Edit) සිදු නොකළ යුතුය

සම්පූර්ණ කරන ලද අයදුම්පත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචි තැපැල මඟින් යොමුකළ යුතුය.




7. **අයදුම්පත ලද බව දැන්වීම**

අයදුම්පත් භාරගැනීම අවසන් වූ පසු මුද්‍රිත අයදුම්පත් දෙපාර්තමේන්තු පද්ධතිය මගින් තහවුරු කල පසු අයදුම්පත ලද බව SMS මගින් අයදුම්කරුට දැනුම් දෙනු ලැබේ.

# INSTRUCTIONS TO COMPLETE ONLINE APPLICATIONS

- **A. The online application should be filled on English BLOCK CAPITAL LETTERS only.**
- **B. “Medium, Town applied, Personal Information” sections of the application of this examination should be completed online.**
- **C. Check and verify that the completed information is correct and in accordance with the instructions given. (According to Common Instructions and Technical Instructions)**
- **D. Then, click on “Submit this application” and “proceed to payment”, pay and click on “Complete and Submit” to submit the application online.**
- **E. Download the softcopy of the application and obtain a hardcopy. (printout)**
- **F. Educational and other details should be written on the application by the applicant in his/ her handwriting.**
- **G. The duly completed hard copy of the application should be mailed in register post. A copy of the application should be kept in hand for any further inquiry.**
- **H. Applicants can change payment methods only once.**
- **I. Applications submitted contrary to the instructions given will be rejected.**

## (A) Common Instructions:

1. Online examination applications should be completed in English medium only.
2. The special characters such as “” ? : {} []’!`~#$%^*<>=+-_| should not be used when completing applications. Applications completed with such special characters will be rejected.
3. Examination fees should be paid only under the following payment methods as instructed by the online system:

i. Through any Bank Credit Card
ii. Through a Bank Debit Card with an online payment facility.
iii. Through the Bank of Ceylon online banking bill payment method
iv. Through any Bank of Ceylon branch
v. Through any Post Office

For details on the above payment methods see **(B) Technical Instructions**

4. The Department of Examinations – Sri Lanka shall not be responsible for any faults that may occur when making payment of examination fees under the methods mentioned in above, and no refund or transfer of payment to any other examination will be possible.
5. Applicant should confirm his or her agreement to the rules and conditions stipulated by the Commissioner General of Examinations, before submitting the perfected application to the online system.
6. A copy of the application should be downloaded and a printout obtained once the application is submitted online after the payment of the examination fee.
7. The following terms and conditions will prevail with regards to the applications:

- Incomplete applications and those bearing false information will be rejected without any notice.
- Applications submitted without paying the prescribed fee (except for specific exams) will be rejected.
- A printed copy of the application should be duly signed and sent through registered post to reach the **Commissioner General of Examinations, Institutional Examinations Organization Branch, Department of Examinations – Sri Lanka, P.O. Box 1503, Colombo** on or before the closing date of applications. If the printed copy is not submitted as above, the online application will be rejected.

8. Any further instructions about completing applications may be obtained by contacting the following telephone numbers.

- Recruitments and qualifications (Public Service Commission) - 011-2136600
- Examination applications and organization – 011 – 2785230
- Payments via post offices – Hotline 1950
- Payments via BOC branches – 011 – 2205280

- If your payment have not been updated in the system, e-mail to "**it@doenets.lk**" with relevant information (Name, NIC, Reference Number, photo of the paid receipt of the payment method)

9. Information contained in the online application shall not be changed under any circumstance after the submission. Therefore, it is the sole responsibility of the applicant to complete and the application accurately before submission.
10. Any amendments made in the printed copy of the application shall not be considered valid.
11. Information contained in the soft copy and the hard copy of the application as at the closing date of applications shall be considered accurate.


## (B). Technical Instructions:

### 1. Access to the system

i. Access the Official Website of the Department of Examinations – Sri Lanka to complete the application. (www.doenets.lk)

ii. Click on the "**Online Applications (Recruitment Exams)**" tile under the "Our Services" tile.


iii. Then you can access the webpage shown below:




2. **“Apply for Exams” Tile:**

i. The information on examinations you can apply for will appear in the below window.


ii. The gazette notification of the examination can be downloaded from there.




➢ **Apply** - It is compulsory to enter your National Identity Card Number in the Login Window first. In addition, you may enter your mobile phone number and/or email address and “√” **“I Agree with Terms and Conditions”** and “√” **reCAPTCHA** and click **“Next.”**



➢ The following window (Verify OTP Window) will appear. Enter the **OTP verification code** received to your mobile phone number (SMS) or e-mail address and then click **"Next."**



## 3. Completing the Application:

Follow the given instructions when completing the following items:

i. It is compulsory to fill all the items marked with * in the online application.

ii. Use ENGLISH BLOCK CAPITALS as in the following example to enter the **Name in Full** and **Name with Initials** in relevant fields.

Personal Information

* Name in full (in Block Capitals)

HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA

e.g : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA

* Name with initials at the end (In Block Capitals)

GUNAWARDHANA H. M. S. K

iii. Consider the following example to fill the Address to which the Admission Card should be sent.

- Enter the correct addresses under the relevant fields as the Address to which the Admission Card should be sent.

  When entering an address, it is mandatory to enter commas as shown in the example below. Failure to follow the instructions may result in not received of exam admission cards.

Official Address (Must use Commas (,) and type IN BLOCK CAPITAL LETTERS as shown in the example) *

MINISTRY OF FINANCE, LOTUS ROAD, COLOMBO 01.

E.g. : MINISTRY OF FINANCE, LOTUS ROAD, COLOMBO 01.

iv. Fill the Medium, Gender, National Identity Card Number and other fields correctly.

- Medium

Medium : *

(●) Sinhala ( ) Tamil ( ) English

Medium cannot be changed once you submitted the application.

- Gender


Sex : *

Female

National Identity Card




- Date of Birth





v. Attestation of Signature of Applicant

- Statements are displayed only to read and understand to attest the declaration and the signature of the applicant in the online application.
- Then, it should be attested by signing on the printed copy.

vi. Making amendments in the completed application

You will see two buttons on the left side as given in the picture below after completing the application.




- **"Save"** - By clicking this, you will be able to fill in your information until the closing date and time of applications. That means you could access the online system again and enter your details. To access the online system again, click on

the tile **“Online Applications (Recruitment Exams)”** under **“Our Service”** and click **“Edit & Submit.”**

However, if you do not click **“Submit this application”** and do not proceed to further activities, your application will be rejected after the closing date and time.

- **“Submit this application”** - Click to proceed after entering all the information in the application.

  The information you entered can be previewed as in the image given below once you click **“Submit this application.”**

**Language Medium**

| | |
|---|---|
| Language Medium | Sinhala |
| Are you appearing at the examination under the disabled rehabilitation condition as per para 01 (ii) of the gazette notification? | No |

**Personal Informations**

| | |
|---|---|
| Name in full (In Block Capitals) | HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA |
| Name with initials at the end (In Block Capitals) | GUNAWARDHANA H.M.S.K. |
| National Identity Card No | 200111111111 |
| Permanent Address (In Block Capitals) | No: 234/1/A, SADAHAM MAWATHA, SOYZAPURA, |
| Postal Town of Permanent Address (In Block Capitals) | MORATUWA. |

Certification of the applicant

Attestation of Applicants’ Signature

Certification of the Head of the Institution (Government/ Provincial Government/Government and Non-Government Co-operation applicants only)

☑ I hereby confirm that the information provided here is accurate, correct and complete.

Proceed to payment

If it is necessary to edit your information, go back to the application (←) edit **(“Edit”)** and click **“Submit this application”** to proceed.

If the information entered is correct, you may proceed by conveying the consent as given in the following image.





You will be directed to the payments page of online examination applications by clicking **"Proceed to payment."**




## 4. Payment of examination fees.

- **Applicants can be allowed to change the payment method only once.**
- Select the payment method through which you intend to pay as given in the image below.




➢ Method of **pay with Credit/ Debit Card**


- 1.7% of the examination fee will be charged as the service fee.
- Make sure that your **Credit/ Debit Card has activated with an online payment facility**.
- Only those Credit/Debit cards can be proceeding to pay by entering the details of your card as given in the image below and clicking **"Pay Now."**
- Otherwise, your payment will be rejected.



- Method of **pay with Post**


  When you pay through the method of "**Pay with Post**", you will be given a reference number as given below. You should take it to any post office, and make the payment and return it to the online system.

  **N.B.: Rs. 20.00 per application will be charged as a service fee by the Post Office when payments are made through the Post Office network.**





- Method of **pay with BOC**

  When you pay through the method of "**Pay with BOC"**, you will be given a reference number as given below. You may pay at any branch of BOC using this reference number or pay through the BOC online banking bill payment method (do not pay for the DOE account number directly) and return to the online system.




**N.B.: Rs. 20.00 per application will be charged as a service fee by the Bank of Ceylon when payments are made through the branch network.**

- After the payment is made, return to the online system and click **"Continue after Payment."**




- Then proceed by entering your **reference number** into the system as given in the image below.



***"If your payment has not been updated in the system, e-mail to "it@doenets.lk" with relevant information (Name, NIC, Reference Number, photo of the paid receipt of the payment method)"***

- After the payment is made utilizing one of the methods given above, the respective **receipt** will be displayed and you may print it. In addition, this information will be sent to your mobile number (through an SMS) and/or to your e-mail address.




Invoice

| Exam | | Price |
|---|---|---|
| OPEN COMPETITIVE EXAMINATION FOR RECRUITMENT TO CLASS I-III OF SRI LANKA INFORMATION AND COMMUNICATION TECHNOLOGY SERVICE - 2019 | | 1000.00 LKR |
| | Convenience fee | 17.50 LKR |
| | **Total** | **1017.50 LKR** |

Proceed

## 5. Submission of the application online


You should agree with the **Terms and Conditions** of the Department of Examinations, Sri Lanka and **confirm** the submission of the application to submit online after the payment is made as given in the image below. Then click **"Complete & Submit."**



6. **Downloading the application and obtaining the printed copy.**

You can download your application by clicking "**Download my application**" as given in the picture below. After downloading, obtain a printed copy of it. No amendment should be made in the printed copy of the online filled details.

A duly completed application should be sent to the Department of Examinations by Registered Post.




7. **Notification of the verified applications**

Once the hard copy of the application is received and verified by DOE system, it will be notified to the applicant via SMS.